මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය-2015

Primary Piriven Year End Term Test - 2015

5 වසර / Grade 5

**සිංහල - II**
**SINHALA - II**

කාලය : පැය 03 යි.
Time : Two hours.

සියලු ම හිමිකම් ඇවිරිණි)
All Rights Reserved)

I කොටසේ ප්‍රශ්න සියල්ලට ම ද, II කොටසින් ප්‍රශ්න හතරක් ද, තෝරා ගෙන ප්‍රශ්න 05කට පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

01) දී ඇති පාඨ ලිහිල් බසින් ලියා , ඉරි ඇඳි පදවල අර්ථ වෙන ම ලියා දක්වන්න.

i. අනේක ප්‍රකාර වූ පුෂ්ප ඵල පල්ලවයෙන් සැදුම් ලද වෘක්ෂ ගණයෙන් ගැවසී ගත්තා වූ.

ii. මුවරදපට පෙරව භෘංග නාදයෙන් ගායනා කෙරෙමින් කැලබැඳ කෙළිනවුන් වැනියහ.

iii. චිත්තෛකාග්‍රතා සංඛ්‍යාත වූ සමාධියට අනුකූල වූ මහමෙවුනා නම් උයනට වැද.

iv. තාරකා සමූහයා විසින් පිරිවරන ලද නභෝ මධ්‍යගත වූ පූර්ණ චන්ද්‍ර මණ්ඩලය මෙන්,

v. ආකාශයෙහි දිව්‍ය වූ පංචාංගික තූර්ය නාදයෝ පැවැත්තාහු ය. මහ මේ නභා පොකුරු වැසි වටුයේ ය. ආකාශයෙහි ශුෂ්ක ගර්ජනාව කළේ ය.

vi. උදය පර්වත නැමති මස්තකයෙහි පලන් රක්තෝත්පලමය වූ මුදුන් මල්කඩක් වැනි වූ අර්ධ සූර්යයා බබළන්නට පටන් ගත් කල්හි.

vii. සර්වාභරණයෙන් සැරසුණා වූ අන්තඃපුර ස්ත්‍රීන් සහිත වූ ප්‍රමාණාතික්‍රාන්ත වූ චතුරංගණී සේනාව විසින් පිරිවරන ලදුව.

viii. අ. සවන් පුදුට සපැමිණි බැලුව කොමළගේ
නුවන් කැලුම් වැද තුඩ මලින වෙයි තගේ

ආ. නීලඹරේ වැජැඹෙන ගන කුළු ලෙසට
මූදු තෙරේ යන එන නැව් පෙනෙය තට

ix. අ. කනලා උපුල් මල් ගවසා කෙස් වැටිය
බිඳ ලා පොකුරුකුරු කැරැ මුතු හර සැටිය

ආ. දිමුත් සඳලුවලැ කෙළනා ළඳ අඳර
සුරත් බැබැළි බිඹු පල යැයි කැරැ අඳර

x. පහත දැක්වෙන උද්ධෘතවල අවස්ථා සම්බන්ධය ලියන්න.

අ. කෙළන ළඳුන් සොමි වුවනින් දිනනුවට
මෙන තුරු සෙන් ගෙන එන පුන් තරිඳු හට

ආ. කිමෙක් ද ? තෝ උන්මාද ඇතියෙහි ද? දැන් ම සූර්යයා අස්තයට ගියේ නොවේ ද? එසේ වූ සූර්ය තෙමේ මේ පූර්ණ චන්ද්‍රයා පසු පස්සෙහි අවුත් කෙසේ නම් හැංගේ ද ?

(ලකුණු 10 x4 =40)

## II කොටස

02) "සිංහල බෝධිවංසය රසවත් ගද්‍ය කාව්‍යයක් වන්නේ කවර හේතූන් නිසා දැයි" සනිදර්ශන ව පහදන්න.

(ලකුණු 15)

03) "ගිරා සන්දේශ කතුවරයා සාම්ප්‍රදයික කවි සමයේ එන උපමාලංකාර භාවිත කළ ද ඇතැම් තැන්වල සිය පෞද්ගලික අද්දැකීම් වර්ණනා සඳහා යොද ගෙන ඇත."මේ පිළිබඳ ව ඔබේ අදහස් දක්වන්න.

(ලකුණු 15)

04) "පියදස සිරිසේනගේ "ඩිංගිරිමැණිකා" ප්‍රබන්ධ කතාවෙන් අපේක්ෂා කළේ සමකාලීන ජාතික ආගමික පුනර්ජීවනය සඳහා දායක වීම හා ඒ සඳහා සමාජය යොමුකරවීම යි."මේ කියමන විමසන්න.

(ලකුණු 15)

05) කොළඹ යුගයේ තරුණ කවීන් බොහෝ දෙනෙකු ස්වභාව සෞන්දර්‍ය වස්තු විෂය කරගෙන සිය නිර්මාණ බිහි කළ ද ඇතැම් කවීන් සමකාලීන සමාජය විවරණය කරන නිර්මාණ ද බිහි කළහ. පද්‍යාවලී I පද්‍ය සංග්‍රහය ඇසුරින් විභාග කරන්න.

(ලකුණු 15)

06) "පද්‍යාවලී I හි අන්තර්ගත කොළඹ යුගයේ මුල් පරපුරේ කවීන්ගේ අවශ්‍යතාව වූයේ ජාතිකත්වය හා ආගමික සංකල්ප නගා සිටුවීම යි" මේ පිළිබඳ ව ඔබේ අදහස් දක්වන්න.

(ලකුණු 15)

07) කාලීන අධ්‍යාපනික තොරතුරු හෙළි කරන මූලාශ්‍රයක් ලෙස ගිරා සන්දේශයේ අගය විමසීමට ලක් කරන්න.

(ලකුණු 15)